00019

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2024/2025
අවසාන පරීක්ෂණය - 2025
SNP8245- විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා පන්ති කාමර කළමනාකරණය
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2025.07.25 වේලාව - ප.ව.02.00 - ප.ව.05.00 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

1. පන්ති කාමර කළමනාකරණය යන පදය නිර්වචනය කර, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සැකසුමක (SEN) එහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

2. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (SEN) සහිත ඉගෙනුම්ලාභීන් සඳහා ගැලපෙන, විවිධ පන්ති කාමර ආසන සැකසුම් වර්ග හතරක් (04) නම් කරන්න.

3. විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට ධනාත්මක ඉගෙනුම් පරිසරයක් සඳහා සහාය විය හැකි, සාමාන්‍ය පන්ති කාමර තුළ යොදා ගන්නා නීති පහක් (05) ලැයිස්තුගත කරන්න.

4. පන්ති කාමර ක්‍රියාකාරකම් අතරතුර ගුරුවරුන් තම සියලුම සිසුන්, ඔවුන්ගේ කාර්යයේ රඳවා තබා ගැනීමට උපකාරී කරගනු ලබන ප්‍රධාන උපායමාර්ග පහක් (05) සඳහන් කරන්න.

5. පාසල් වර්ෂය ආරම්භ වීමට පෙර ගුරුවරයෙකු තම පන්ති කාමරයේ සාර්ථකත්වය සඳහා, සූදානම් කළ හැකි ක්‍රම හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න.

6. සමීපතා පාලනය යන්න (proximity control) කෙටියෙන් විස්තර කර, පන්ති කාමර කළමනාකරණයේදී එය භාවිතා කිරීමේ ප්‍රතිලාභ තුනක් (03) ලැයිස්තුගත කරන්න.

7. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (SEN) සැකසුම් තුළ, ඵලදායී පන්ති කාමර කළමනාකරණයට දායක වන වැදගත් සංරචක පහක් (05) නම් කරන්න.

8. පන්ති කාමර කළමනාකරණයතුළදී නීති සහ ක්‍රියා පටිපාටි අතර වෙනස උදාහරණ දෙකක් (02) භාවිතයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x08 = ලකුණු 40)

## 2 වන කොටස

9. (i) ළමුන් තුළ ස්වයං කළමනාකරණය පිළිබඳ සංකල්පය පැහැදිලි කර, එම සංකල්පය පන්ති කාමර හැසිරීම් සංවර්ධනය සඳහා උපකාරී වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(ii) පාසල් යන වයසේ දරුවන් තුළ චිත්තවේගීය හා හැසිරීම් ගැටළු ඇතිවීමට හේතු විශ්ලේෂණය කරන්න. මේ සඳහා පන්තිකාමරයේ සුදුසු උදාහරණ දෙකක් (02) සපයන්න. (ලකුණු 07)

(iii) පන්තියට නිතර බාධා කරන තුන (3) ශ්‍රේණියේ සිසුවෙකු සඳහා පුළුල් හැසිරීම් අනුවර්තන සැලැස්මක් යෝජනා කරන්න. මෙහිදී යොදා ගනු ලබන උපස්ථම්භන උපාය මාර්ග සහ අපේක්ෂිත ප්‍රතිඵල ඇතුළත් කරන්න. (ලකුණු 08)

10. (i) ඵලදායී පන්ති කාමර කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමේදී, ශක්තිමත් ගුරු-ශිෂ්‍ය සබඳතා ගොඩනගා ගැනීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. එවැනි සබඳතා ගොඩනගා ගැනීමට ගුරුවරුන්ට භාවිත කළ හැකි ප්‍රායෝගික ශිල්ප ක්‍රම දෙකක් (02) සපයන්න. (ලකුණු 05)

(ii) නුසුදුසු පන්ති කාමර හැසිරීම් සඳහා පොදු හේතු තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) අන්තර්කරණ පන්ති කාමරයක් තුළ සමාජ කුසලතා සංවර්ධනය සහ දිරිගැන්වීම සඳහා, පන්තිකාමරයට උචිත කුඩා සැලැස්මක් සකස් කරන්න.

ඔබේ සැලැස්මට උදාහරණ සමඟ භූමිකා රංගන, සහයෝගී ඉගෙනීම් සහ සම වයස් මිතුරන්ගේ සහාය වැනි උපාය මාර්ග තුනක්වත් (03) ඇතුළත් විය යුතුය. (ලකුණු 08)

11. (i) අන්තර්කරණ පන්ති කාමරයක් කළමනාකරණය කිරීමේදී විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත (SEN) ගුරුවරයෙකුගේ ප්‍රධාන වගකීම් පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට උගන්වන ගුරුවරුන් සඳහා පන්ති කාමර කළමනාකරණය වැඩිදියුණු කිරීමට, සම වයසේ මිතුරන් පුහුණු කිරීමේ සහ සම වයස් මිතුරන්ගෙන් උපදෙස් ලබා ගැනීමේ වැදගත්කම ගැන, සුදුසු උදාහරණ සමඟ කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii) ඔටිසම් හෝ ADHD සහිත සිසුන් අන්තර්කරණය කිරීම, වැඩි දියුණු කිරීමට සිසුන් විසින් මෙහෙයවනු ලබන ක්‍රියාකාරකම්, තාක්ෂණය පදනම් කරගත් සහාය සහ සිසුන්ගේ පැහැදිලි හැසිරීම් අපේක්ෂාවන් ඇතුළත්ව පන්ති කාමර කළමනාකරණ සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 08)

12. (i) පන්ති කාමරය තුළ සහ ඉන් පිටත විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ අධ්‍යයන හා සාමාජීය සාර්ථකත්වය සඳහා ගුරුවරුන්ට සහාය විය හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (SEN) සැකසුම් තුළ ගුරුවරුන් සහ සිසුන් අතර සබඳතා ගොඩනැගීමේ ප්‍රතිලාභ විශ්ලේෂණය කරන්න. මෙම සබඳතා ශක්තිමත් කිරීම සඳහා ගුරුවරුන්ට භාවිත කළ හැකි උපාය මාර්ග දෙකක් (02) ඇතුළත් කරන්න (ලකුණු 07)

(iii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්හට උගන්වන ගුරුවරුන් විසින් පාඩම් සැලැස්මක් සකස් කිරීමේදී විවිධ ඉගෙනුම් අවශ්‍යතා සලකා බැලිය යුත්තේ ඇයි? සුදුසු උදාහරණ සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. (i) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (SEN) සහිත දරුවන් සඳහා ධනාත්මක ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) දෙමාපියන් සමඟ ඵලදායී සන්නිවේදනය සහ සහයෝගීතාවය තුළින්, අන්තර්කරණ පන්ති කාමරවල සිසුන්ගේ හැසිරීම සහ අධ්‍යයන ඵල වැඩිදියුණු කිරීම සිදු කළ හැකි ආකාරය කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii) නිර්මාණාත්මක අන්තර්කරණ ඉගෙනුම් වාතාවරණයක් සඳහා සහාය වීමට, ධනාත්මක ගුරු- ශිෂ්‍ය සහ දෙමාපිය - ගුරු සබඳතා ගොඩනැගීමට ගුරුවරයෙකු විසින් භාවිත කළ හැකි ක්‍රම තුනක් (03) ඇතුළත් කුඩා සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 08)

14. (i) පන්ති කාමරයේ ඉගෙනීමට බලපෑම් කළ හැකි සිසුන්ගේ අභියෝගාත්මක හැසිරීම් සඳහා හේතු හතරක් (04) හඳුනා ගන්න. (ලකුණු 05)

(ii) සිසුන්ගේ අභියෝගාත්මක හැසිරීම් වලට ප්‍රතිචාර දැක්වීමේදී සහ එම හැසිරීම් කළමනාකරණයේදී, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (SNE) ගුරුවරයාගේ භූමිකාව විශ්ලේෂණය කරන්න. (ලකුණු 07)

(iii) ධනාත්මක දිරිගැන්වීම්, නිසි හැසිරීම් රටාවන් සහ සැලසුම් සහගත චර්යාවන් වැනි ක්‍රියාශීලී උපාය මාර්ග ඇතුළත් කුඩා පන්ති කාමර හැසිරීම් කළමනාකරණ සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 08)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*